# පැරණි ලක්දිව රාජ්‍ය පාලනයේ ස්වරූපය අභිලේඛන මඟින් හෙළිවන ආකාරය

එම්. පියුමි හංසමාලි[26]

පැරණි ලංකාවේ පාලකයන් අතර ප්‍රජාතන්ත්‍රවාදී හැඟීම් නොපැවති බව ලංකාවේ පමණක් නොව ලොව පුරා ප්‍රකට වී ගිය මතයකි. මේ නිසාවෙන් අපේ සිංහල රජවරු ඒකාධිපති පාලනයක් ගෙනයන ලද්දේ දැයි අභිලේඛන මත පදනම් ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය හරහා සිදුවිය. මෙරට පැවති දේශපාලන ව්‍යුහයේ ස්වභාවය අධ්‍යයනයට ඇති මහාවංසය, දීපවංසය ආදී ප්‍රාථමික සාහිත්‍යය මූලාශ්‍රයන් තෝරා ගැනීමේ දී එ වැනි ග්‍රන්ථයන් තුළ ප්‍රමුඛ ලෙස විග්‍රහ වන්නේ රටේ ආගමික වටපිටාව වීමත් බෞද්ධ භික්ෂූන් වහන්සේලා අතින් වැඩි වශයෙන් මෙ වැනි ග්‍රන්ථ රචනා වීමත් නිසා ආගමික කාර්යයන්ට දායක වූ පාලකයන් සම්බන්ධ ව සඳහන් කිරීමේ දී රටේ පැවති දේශපාලනික තත්ත්වය වක්‍රාකාර ව ඉදිරිපත් වේ .නමුත් අභිලේඛන මූලාශ්‍රයන්ට රට තුළ දේශපාලනයට ඍජු ලෙස සම්බන්ධ රජු හා පාලක පැලැන්තිය විසින් පිහිට වීම් නිසාත් පැරණි ලක්දිව පාලන ලක්ෂණ අධ්‍යයනයේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් වශයෙන් අභිලේඛන අතිශය වැදගත් වේ. තව ද ලංකාවේ පාලනය එදා ගෙන ගියේ උතුරු ඉන්දියානු පාලන ක්‍රමය අනුව යැයි බොහෝ දෙනාගේ අදහස වුව ද උතුරු ඉන්දියාවට වඩා ප්‍රජාතන්ත්‍ර ක්‍රමයකින් මෙ රට පාලනය වූ බව අභිලේඛන අධ්‍යයනයේදී පැහැදිළි වේ. මහජන පක්ෂපාතීත්වය මත රටේ බලය ලබා ගැනීමට හැකි වන නිසා මෙ රට රජවරු ජන මතයට ඇදී ගියහ. උදාහරණයක් ලෙස වරද කළ අයට දඬුවම් පැමිණවීම් ආදී කාර්යය ප්‍රාදේශීය මණ්ඩල වලට පවරා තිබූ බව බදුලු ටැම් ලිපියෙන් සනාථ වීමෙන් එ කල පාලන රටාවේ පැවති විමධ්‍යගත ආකාරය තහවුරු වේ. මේ නිසාවෙන් පැරණි ලංකාවේ පාලන ව්‍යුහය අධ්‍යනය කිරීමේ දී අභිලේඛන සුවිශේෂී වේ. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් යටතේ වන අභිලේඛනල මෙම පර්යේෂණ මාතෘකාවට අදාළ ව කරුණු රැස් කිරීමේ දී භාවිත කළ ප්‍රධාන ක්‍රමවේදය වන අතර එහි දී ලෙන් ලිපි, ගිරි ලිපි, ටැම් ලිපි, පුවරු ලිපි හා සන්නස් ආදිය උපයෝගී කර ගන්නා ලදී. මෙම පර්යේෂණය තුළින් ලබුණු ප්‍රතිඵල වූයේ ප්‍රජාව විසින් "ප්‍රජාව සඳහා නියැලුණු ප්‍රජාවගේ පාලන ක්‍රමයක් සහිත ඍජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක්" නොපැවති බවත් ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණය යැයි හඳුනාගත හැකි පුද්ගලික නිදහස, දේශපාලනික නිදහස, ආර්ථික නිදහස හා ආගමික නිදහස යන අංගවල අඩු වැඩි වශයෙන් විවිධ කාලයන් තුළ මෙ රට පාලන තන්ත්‍රය තුළ පැවති බවත් එනිසා රාජ්‍ය පාලනය ඒකාධිපතීත්වයෙන් යුත් දරදඬු මානව අවශ්‍යතාවයන් ඉටුනොවුණු පාලන රටාවක් නොවන බවත් මානව නිදහස කෙරෙහි අවධානය යොමු කරන ලද විමධ්‍යගත පාලන රටාවක් බව තහවුරු විය.

ප්‍රමුඛ පද: ප්‍රජාතන්ත්‍රවාදය, අභිලේඛන, රාජ්‍ය

[26] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැළණිය විශ්වවිද්‍යාලය, piumistpiumiperera@gmail.com.